## ජවිපෙ අන්දවා දංගෙඩියට යැවීම

අපට ඇත්තේ මෙරටට ආවේණික දැක්මක් ය. ඒ දැක්මෙහි ප්‍රවාද හා සංකල්ප මෙන්ම වර්ධනය වෙමින් පවත්නා අදහස් ද වෙයි. ප්‍රවාද හා සංකල්ප ද වර්ධනය වන බව නො කිවමනා ය. මේ සියල්ල පදනම් වී ඇත්තේ මෙරට චින්තනයෙහි ය. අපට චින්තනය පිළිබඳ ද ප්‍රවාදයක් ඇත. ඒ ප්‍රවාදය ද නිර්මාණය කෙරී ඇත්තේ අපේ චින්තනය පදනම්කරගනිමින් ය. එවැනි වාක්‍ය දෙකක් එකක් පසුපස ලිවිය හැක්කේ චක්‍රීය චින්තනයක බව බොහෝ දෙනාට මේ වනවිට වැටහෙනු ඇත. අපේ දැක්ම අනුව ශ්‍රී ල නි පක්ෂයෙහි අනාගතය ගැන අපි කීවෙමු. චන්ද්‍රිකා කුමාරතුංග මහත්මියගේ නායකත්වය යටතේ ඒ පක්ෂය සිංහලත්වයට එරෙහිව කටයුතුකිරීමට ප්‍රවණතාවයක් ඇති බවත් පක්ෂය ජාතික චින්තන මතවාදවලින් ඉවත්වත් ම එය දිය වී යනු ඇති බවත් සඳහන් කෙළෙමු. එමෙන් ම ජ වි පෙ ජාතික චින්තන මතවාදවලට නැඹුරුවීමේ ප්‍රතිඵලයක් ලෙස එයට සංධානයේ ප්‍රධාන පක්ෂය විය හැකි බවත් කීවෙමු.

එහෙත් මෙයින් කියැවෙන්නේ ශ්‍රී ල නි පක්ෂය දිය වී ඇති බව හා දැනටමත් ජ වි පෙරමුණ සන්ධානයෙහි ප්‍රධාන පක්ෂය වත ඇති බව හෝ නො වෙයි. ඇතැම් කරුණු යටතේ එවැනි තත්ත්වයක් උදා විය හැකි බව පමණක් අපි කීවෙමු. එහෙත් ඒ ලිපියෙන් පසුව ජ වි පෙ ඇන්දවීම තම කොන්ත්‍රාත්තුව කරගත් පුද්ගලයෙක් පසුගිය පළාත්සභා ඡන්ද ප්‍රතිශත ආශ්‍රයෙන් වැරදි සංඛ්‍යානමය දත්ත යොදාගෙන, ඒ විවරණය කරමින් දැනටමත් ජ වි පෙ සන්ධානයෙහි ප්‍රධාන පක්ෂය වී ඇති බව පෙන්වීමට අසාර්ථක උත්සාහයක් දරා ඇත. ජ වි පෙ මෙවැනි ඊනියා විශ්ලේෂණවලින් නොමග නොයනු ඇතැයි බලාපොරොත්තු වෙමු.

මෙවැනි විශ්ලේෂණවලින් ජ වි පෙ නොමග යැවීමට හෙවත් ඇන්දවීමට තැත්කරන අතර ඉහත සඳහන් පුද්ගලයා හා තවත් අය ඔවුන් 1987-89 අවධියෙහි දී සිදුකලාක් මෙන් ජ වි පෙ තරුණ තරුණියන් හා අනුගාමිකයන් පමණක් නොව සමස්ත ජාතික ව්‍යාපාරයම දංගෙඩියට දැක්කවීමට ද කටයුතු කරනු ඇත. එය විවිධාකාරයෙන් කෙරෙනු ඇත. අපි උදාහරණයක් පමණක් ගනිමු. අන්තර පාලනය යනුවෙන් අද හඳුන්වනු ලබන උතුරු හා නැගෙනහිර පළාත්වලට වෙනම පාලන ක්‍රමයක් සඳහා සන්ධාන ආණ්ඩුව එකඟකරගැනීමේ අවශ්‍යතාව අද බටහිර රටවලට වෙයි. කොටි ත්‍රස්තවාදීහු අන්තර්පාලනය සාකච්ඡා නොකෙරෙන්නේ නම් ඊනියා සාම සාකච්ඡාවලට සහභාගි නොවන බව කියති. ජ වි පෙ එවැනි සාකච්ඡාවලට විරුද්ධ ය. එහෙත් ශ්‍රී ල නි පක්ෂයේ බහුතරය කෙසේවෙතත් චන්ද්‍රිකා කුමාරතුංග මහත්මිය සාකච්ඡාවලට එකඟ ය. ඇය ඒ බව ප්‍රකාශකර තිබුණ ද දැන් කියන්නේ තම ස්ථාවරය වෙනස්කරගෙන නොමැති බව ය. ඇගේ ස්ථාවරය නිතර වෙනස්වන බැවින් වෙනස්කරගෙන නොමැති ස්ථාවරය යනුවෙන් ඇය හඳුන්වන්නේ කිනම් ස්ථාවරය ද යන්න දන්නා අයකු නැත. එහෙත් ඇය සන්ධානයේ නායකත්වයෙන් අස්වී ඇත්තේ හුදෙක් වැඩ වැඩි නිසා යැයි පිළිගැනීමට අප සූදානම් නැත. අන්තර පාලනය පිළිබඳ සන්ධානය ලවා ඇයට වුවමනා දේ කරගැනීමට නොහැකිවීම ද මේ අස්වීම පිටුපස ඇති බව  පැහැදිලි ය.

බටහිර රටවල් සන්ධාන ආණ්ඩුවට බලපෑම් දමන්නේ අන්තර පාලනයට එකඟකරගැනීමට ය. සොල්හයිම් ඇතුළු නෝර්වේ නියෝජිතයන් පහසුකම් සපයා ඇත්තේ කොටි ත්‍රස්තවාදීන්ට “යුද්ධයට” සූදානම්වීමට බව බටහිරයන්ට අවශ්‍ය අන්දමට ලෝකය නොබලන ඕනෑම අයකුට දැන්වත් පැහැදිලි විය යුතු ය. නෝර්වේ නියෝජිතයන් කෙළේ කොටි අවශ්‍යතාවන් සඳහා ආණ්ඩුව එකඟකරවාගැනීම පමණ ය. එක්සත් ජාතික පක්ෂ ආණ්ඩු සමයෙහි එය ප්‍රශ්නයක් නොවූයේ ඒ ආණ්ඩුව කොටි යෝජනා පිළිගැනීමට නිරන්තරයෙන් ම සූදානමින් සිටි බැවින් ය. නෝර්වේ යමදූතයෝ (ඔවුන්ට සාමදූතයන් යැයි කියන්නේ බටහිරයන් හා බටහිර අනුගාමිකයන් ය.) කිසි දිනක ආණ්ඩුවේ යෝජනාවක් හෝ ස්ථාවරයක් සඳහා කොටි ත්‍රස්තවාදීන් එකඟකරගැනීමට උත්සාහ නො කළහ. අද ද නොකරති. ඔවුන්ට අද අවශ්‍යවන්නේ කෙසේ හෝ අන්තර පාලනය සඳහා සන්ධාන ආණ්ඩුව එකඟකරවාගැනීමට ය.

මේ අතර එක්සත් ජාතික පක්ෂය විවිධ කතා කියමින් ඔවුන්ගේ පිළිවෙත ප්‍රකාශකරයි. ඔවුහු අන්තර පාලනයක් දීම සඳහා ඊනියා සාම සාකච්ඡාවලට එකඟවෙති. එපමණක් නොව ඔවුහු ජ වි පෙ ආණ්ඩුවෙන් යන්නේ නම් ආණ්ඩුවට එක්වීමට ද කැමැත්ත පළකරති. අද නැවතත් මනෝ - මලික් යුවළ කරළියට පැමිණ ඇත. මනෝ-මලික් යුගලය කැඩී ගියේ සන්ධානය පිහිටුවීමෙන් පසුව ය. එහෙත් සන්ධානයට අකුල් හෙළමින් යුගලය ශ්‍රී ල නි ප හා ඒ ජා ප

© Prof. Nalin De Silva

එකතුකිරීමට වෑයම්කළ අන්දම බොහෝ දෙනාට මතක ය. අද බටහිරයන්ට අවශ්‍ය වී ඇත්තේ ද ජ වි පෙ සන්ධානයෙන් එළවා එයට එ ජා ප ඇතුල්කිරීම ය.

මේ අතර ජී එල් පීරිස් මහතා තම නිවට බව මනාව පැහැදිලිකරන දේශද්‍රෝහී කතාවක් කර ඇත. ඔහුගේ ප්‍රකාශය ඊනියා සාම සාකච්ඡා ඇතිකර ජපානයෙන් ලැබීමට නියමිත කෝටි ගණනක මුදලක් ලබාගැනීම සම්බන්ධයෙන් ය. මෙයින් අදවත් පැහැදිලිවිය යුතු කරුණ නම් ජපානය බටහිරයන්ගේ අවශ්‍යතාවය ද නිසා ලංකාවට දෙන ඊනියා ආධාර හෙවත් ණය ද්‍රෝහී සාම සාකච්ඡා සමග සම්බන්ධකර ඇති බව ය. ඊනියා සාම සාකච්ඡා නැත්නම් ණය නැත. ණය නැතිව ආණ්ඩුකරන්නේ කෙසේ දැයි මෙරට නායකයන් යැයි කියාගන්නෝ නො දනිති. අද සියළු ණය ඊනියා සාම සාකච්ඡා සමග බැඳී ඇත. බටහිරයන් හා ජපානය අද කරන්නේ අප රටට වක්‍රව ආර්ථික තහංචි පැණවීම ය. මේ බව අප හොඳින් වටහාගත යුතු ව ඇත. බටහිරයන්ට අවශ්‍ය නම් අන්තර් පාලනය අත්හැරීමට ප්‍රභාකරන්ට බලකර සිටිය හැකි ය. ප්‍රභාකරන් එයට අකමැති නම් ඒ ත්‍රස්තවාදියා කොටි සංවිධානයේ නායකත්වයෙන් ඉවත්කිරීමේ හැකියාව ද ඔවුන් සතුව ඇත. එහෙත් ඔවුහු එසේ නොකරති. ඔවුන්ට අවශ්‍ය බලපෑම් මධ්‍යයෙහි ආණ්ඩුව අන්තර් පාලනයට එකඟකරවාගැනීමට ය. ඒ සඳහා ඔවුන් වක්‍රව මෙන්ම සෘජුව ද ආර්ථික තහංචි පණවනු ඇත.

බටහිරයන්ගේ සැලැස්ම කුමක් දැයි අපි නිසියාකාරව තේරුම්ගත යුතු වෙමු. අරාබි මුස්ලිම් රටවල්, කියුබාව හා චීනය හැරුණු විට බටහිරයන්ගේ වෛරයට ලක් වී ඇති ජන කොටස සාමාන්‍ය සිංහල බෞද්ධයන් යැයි කීමෙහි වරදක් ඇතැයි මම නො සිතමි. බටහිරයන්ගේ වෛරයට පාත්‍ර වූ රටවල් අතර එකල ප්‍රධාන වූයේ සෝවියට් දේශය ප්‍රමුඛ සමාජවාදී යැයි හඳුන්වනු ලැබූ රටවල් ය. එහෙත් ඒ රටවල්වල ධනපති ක්‍රමය පිහිටුවීමෙන් පසුව ඒ රටවල් ද බටහිර ක්‍රිස්තියානි නූතනත්ව ව්‍යාපෘතිය තුළට ගැනීමට බටහිරයෝ සමත්වූහ. පසුගිය අවුරුදු පන්සීය මුළුල්ලේ ම ලෝකයේ ක්‍රියාත්මක වන්නේ මේ ව්‍යාපෘතිය ය. එනම්, බටහිර ක්‍රිස්තියානි සංස්කෘතික ආධිපත්‍යය තුළට අනෙක් රටවල් ද ගැනීම ය. අද ඒ සංස්කෘතියට විරුද්ධ ප්‍රධාන බලවේගය අරාබි මුස්ලිම් සංස්කෘතිය මත පදනම් වෙයි. සිංහල බෞද්ධ සංස්කෘතිය ද බටහිර ක්‍රිස්තියානි සංස්කෘතික ආධිපත්‍යයට එරෙහි ව යමක් කළහැකි සංස්කෘතියක් බව බටහිරයෝ දනිති. මහායාන සංස්කෘතිය බටහිර සංස්කෘතියට එතරම් තදබල තර්ජනයක් නො වෙයි. අද බටහිර රටවල ඉතා සුළුවෙන් හෝ ජනප්‍රිය වන්නේ මහායාන සංස්කෘතිය මිස සිංහල ථෙරවාදය නො වෙයි. හින්දු සංස්කෘතිය ද බටහිරට විශාල තර්ජනයක් නො වෙයි. රට කුඩා වුව ද සිංහලයන්ගේ සංඛ්‍යාව කුඩා වුව ද බටහිර ක්‍රිස්තියානි සංස්කෘතියට සිංහල ථෙරවාදී බෞද්ධ සංස්කෘතිය තර්ජනයක් බව අපට වඩා හොඳින් බටහිරයෝ දනිති.

ගිවිසුමකින් රට භාරදුන්නා මිස සිංහලයෝ කිසි දිනෙක බටහිරයන්ට යටත් නො වූහ. ඉතා ටික කලක් පමණක් පැවති යාපන රාජධානිය පෘතුගීසීන්ට යටත්වීමෙන් පසුව එහි විසූ දෙමළ ජනයාගෙන් බටහිර යටත්විජිතවාදයට එරෙහි ව සටනක් නූනා පමණක් නොව ඒ ජනගහණය ද කෙමෙන් නැති වී ගියේ ය. ඉන් පසු ලන්දේසීන් දුම්කොළ වගාවට ගෙනා සෙනගින් නැවත යාපනයේ ස්ථිර පදිංචිකරුවන් ඇතිකිරීම ඇරඹිණි. ඒ පිරිස් කිසි දිනෙක ලන්දේසීන්ට හෝ ඉංගිරිසින්ට හෝ එරෙහිව සටන් නොකළහ. එහෙත් සිංහලයෝ එසේ නො වෙති. 1817-18, 1848 ආදිය ඉංගිරිසින්ට අදත් මතක ය. ඒ සටන් ඉතා කෲර ලෙස මර්දනයට කිරීමට ඉංගිරිසිහු පියවර ගත්හ. අද ද ඔවුහු ඒ සඳහා සූදානම් වෙති. බ්‍රවුන්රිග්ලා ටොරිංග්ටන්ලා සිදු කළ ම්ලේච්ඡ ක්‍රියා ඉක්මවන ක්‍රියා සිංහල ජාතිකත්වයට එරෙහිව ක්‍රියාත්මක කිරීමට බටහිරයෝ දෙමළ ජාතිවාදය උපයෝගි කරගනිති. මේ ක්‍රියාවලියෙහි උරගල වනු ඇත්තේ අන්තර් පාලනය ය. ජ වි පෙ මර්දනය කිරීමට සහාය දුන් බටහිරයෝ  කොටි වැනසීමට සහාය දෙනු වෙනුවට ඒ පවත්වාගෙන යති. අද ඔවුන්ට අවශ්‍ය ජ වි පෙ ආණ්ඩුවෙන් පන්නා එ ජාප ආණ්ඩුවට එක්කර ඒ ඇතිවන හවුල් ආණ්ඩුවෙන් අන්තර් පාලනය දීමට ය. එහි දී ආණ්ඩුවට පිටින් ජ වි පෙ හා ජාතික බලවේග එයට විරුද්ධවන විට බ්‍රවුන්රිග් හා ටොරිංග්ටන් ඉක්මවා යන ආකාරයෙන් භික්ෂුන් වහන්සේලා, ජ වි පෙ හා සිංහල ජාතික බලවේග විනාශ කිරීම ය. අප එයට ඉඩදිය යුතු නැත. ජ වි පෙට මහා බලයක් ඇතැයි පෙන්වා, එය අන්තර් පාලනයට විරුද්ධ වෙමින් ආණ්ඩුවෙන් ඉවත්විය යුතු යැයි උපදෙස් දීමට ජාතික බලවේග සමග උඩින් සිටින එහෙත් බටහිරයන්ගේ නියෝජිතයන් වූ පුද්ගලයන් කටයුතු කරනු ඇත. මොවුහු 1987 -89 දී ජ වි පෙ නායකයන් දංගෙඩියට යැවූහ. අද ජ වි පෙ කළ යුත්තේ ආණ්ඩුවෙන් මොහොතකටවත් ඉවත් නොවී ආණ්ඩුව තුළ හිඳිමින් ම අන්තර් පාලනයට විරුද්ධවීම ය ~

© Prof. Nalin De Silva